# <u>කොළඹ දිසා අධිකරණයේදීය.</u>

කොළඹ ලෝටස් පාරේ අංක. 55, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණ පාරේ හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම පිළිබඳ වන කාර්යය සම්බන්ධයෙනි. සහ,

නඩු අංකය: 217/සී.ඕ.

1982 අංක 18 දරණ සමාගම් පනතේ ix කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම පිළිබඳව වන කාරණය සම්බන්ධයෙනි.

නිහාල් ශ්‍රී අමරසේකර, අංක. 167/4,
විපුලසේන මාවත,
කොළඹ 10.

**පෙත්සම් කරු**

වර්ෂ 2007 ක්වූ 9 මස 10 වෙනි දිනදීය.

මෙම නඩුවේ මදිහත්වන වගඋත්තරකාර ශ්‍රී ලංකා ජනරජයේ නීතිපති (මින්මතුවට වගඋත්තරකරු ලෙස හඳුන්වනු ලබන) ස්වකීය නීතිඥ ප්‍රියානි ඇන්ජලින් කුමාරුපේරු පීරිස් මිය සහ ඇයගේ සහකාර නීතිඥවරුන් වන මල්වත්තගේ සුජාතා රංජනී පීරිස්, අනුසූයා ශන්මුගනාදන්, මොරගොඩ කංකානමලාගේ ලිලන්ති අලුවිහාරේ, සරත් ගාමිණී වික්‍රමසිංහ, සින්ති රිස්නි හිරදවස්, ගුණනන්දාවඩු නිමාලිකා ද සොයිසා වික්‍රමසිංහ, ලොකුරාළලාගේ දොන් කැලනි දිප්තිකා පියසේන, සොනාලි දර්ශිකා කොල්ලුරේ ගාමිණිද අල්මේදා, සේපාලිකා ගංගානි ජයතිලක තිරාණගම, සොනාලි ක්‍රිෂාන් ෆරිස් පෙරේරා, උපේන්ද්‍රා සජීවනී යග්ගහවිට, චමින්දා ශ්‍රීපාලි ද සිල්වා සහ දඹුල්ල ආරච්චිගේ පූර්ණා දමයන්ති පෙරේරා යන අය මගින් පෙනී සිටිමින් සිය විරෝධතා ප්‍රකාශය මෙසේ ප්‍රකාශ කර සිටී.

01. මින්මතුවට ප්‍රකාශිතවම පිළිගන්නා කරුණු හැර පෙත්සම්කරුගේ පෙත්සම සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූප ඡේදවල සඳහන් අන් සෑම සියළු කරුණක්ම මෙම වගඋත්තරකරු තරයේ ප්‍රතික්ෂේප කර සිටී.

02. පෙත්සම්කරුගේ පෙත්සමේ 1, 2, 3(ඒ) සහ 5 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූප ඡේදයන්හි සඳහන් සම්ප්‍රකාශයන් මෙම වගඋත්තරකරු පිළිගනී.

03. පෙත්සම්කරුගේ පෙත්සමේ 3 (b) ඡේදයට සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූප ඡේදයන්හි සඳහන් කරුණුවලට පිළිතුරු දෙමින් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනයත්, දක්වා ඇති පරිදි කොටස් නිකුත් කර ඇති බවත් සහ නාම මාත්‍ර අගයන් ද පිළිගන්නා බවත්, එහි සඳහන් අනිකුත් සම්ප්‍රකාශයන් නෛතික අර්ථකතනයක් හෝ තීරණයක් මගින් තීරණය වියයුතු බවත් එසේ හෙයින් එම සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරන බවත්ය.

04. i. පෙත්සමෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි 4 (ඒ) සම්ප්‍රකාශයන් වගඋත්තරකරු පිළිගනී.

ii පෙත්සමෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි 4 (බී), 15 (බී), 21(බී) සහ 24 (සි) සම්ප්‍රකාශයන්වලට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, එහි සඳහන් පැ.2 (ඒ) සහ පැ.2(බී) යන ලේඛනත් අංක 673 සහ 674 යන විශේෂ ප්‍රදාන පවාරණය කිරීමේ සාධන පත පමණක් පිළිගන්නා බවත් එහි අනිකුත් සම්ප්‍රකාශයන් නෛතික අර්ථකතනයක් හෝ තීරණයක් මගින් තීරණය විය යුතු බවත් එසේ හෙයින්, එම සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරන බවත්ය.

iii. පෙත්සමෙ 4(සි) සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන් වලට පිළිතුරු දෙමින් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, එහි සඳහන් කරුණු සම්බන්ධව නෛතික අර්ථකථනයක් හෝ තීරණයක් දියයුතු බවත්, එසේ හෙයින් එකී කරුණු ප්‍රතික්ෂේප කරන බවයි.

05. පෙත්සමෙ 06 ඡේදයෙහි සහ දිවුරුම ප්‍රකාශයේ රට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, කොළඹ දිසා අධිකරණයේ අංක. 3155(විශේෂ) දරණ නඩුව පවරා ඇති බවත් පී.4 ලෙස ලකුණු කරන ලද ලිපිය පිළිගන්නා බවත් එහි අනකුත් සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කර සිටින බවත්ය..

06. පෙත්සමේ 07 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, 1995 ජූනි 28 දින එහි සඳහන් සමථ ගිවිසුම් පත්‍රය අත්සන් කරන ලද බවත්, ජපන් කොන්ත්‍රාත්කරුවන් විසින් ජපන් යෙන් මිලියන 17,586 කපා හරින ලද බවත් කෙසේ වුවද, එකී කපා හැරීම එච්.ඩී.එල්. සමාගම විසින් ජපන් ආයෝජකයන්ට ගෙවිය යුතු මුදල මිස, ශ්‍රී ලංකා ජනරජය විසින් දෙන ලද ඇපය මත ගෙවිය යුතු බවට

පෙත්සමේ දන්වා ඇති පරිදි නොවන බවයි. තවද, පෙත්සමට ගොනු කරන ලද පැ.5(ඒ), පැ.5(බී) ලේඛන මෙම වගඋත්තරකරු පිළිගන්නා බවත්, සමථ ගිවිසුම පරිදි ඉතිරි මුදල වර්ෂ 2010 වනතෙක් ගෙවීමට හැකි බවත් එහි අනිකුත් සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කර සිටින බවත්ය.

07. පෙත්සමේ 08 සහ 10 ඡේදයන්හි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ කොළඹ දිසා අධිකරණයේ 4292/විශේෂ, 4447/විශේෂ, 4413/විශේෂ, 4414/විශේෂ, 4785/විශේෂ 4791/විශේෂ සහ 5095/විශේෂ සහ මහාධිකරණය (සිවිල්) 1/1998 (2) දරණ නඩු සහ එහි සඳහන් අතුරු තහනම් නියෝග සහ පෙත්සමේ 10(ඩී) වගන්තියේ සඳහන් කරුණු පිලිගන්නා අතර, එහි සඳහන් අනිකුත් කරුණු ප්‍රතික්ෂේප කර සිටින බවත්ය.

08. පෙත්සමේ 09 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, එහි සඳහන් පරිදි විගණනය කළ වාර්ෂික ගිණුම් 1990 මාර්තු මස සිට කොටස්කරුවන්ට ලබා නොහැරිය ඇති බවට සහ එච්.ඩී.එල්.සමාගමේ කොටස් දැනට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු ස්ථානයේ පැහැර හැරීමේ මණ්ඩලයේ වෙළඳගනව පවතින බවත් පිලිගන්නා අතර, එහි සඳහන් අනිකුත් සියලු සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කර සිටී. තවදුරටත් පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත සඳහන් පරිදි පැහැරහැරීමේ මණ්ඩලයේ වෙළඳගනව පවතින්නේ නඩු හේතුවෙන් නිකුත් කිරීමට නොහැකි වී ඇති විගණන වාර්තා හේතුවෙන් මිස පෙත්සම්කරු ප්‍රකාශ කරන පරිදි එච්.ඩී.එල් හි බංකොලොත් තත්ත්වය හේතුවෙන් නොවන බව විශේෂයෙන්ම ප්‍රකාශ කර සිටී.

09. පෙත්සමේ 11 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්හි සත්‍යතාවය නොදන්නා හෙයින් මෙම වගඋත්තරකරු ප්‍රතික්ෂේප කර සිටී.

10. පෙත්සමේ 12 සහ 13 ඡේදයන්හි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ කොළඹ දිසා අධිකරණ නඩු අංක. 4414/විශේෂ සහ 5095/විශේෂ යන නඩු පවරා ඇති බවත්, 13(බී) සිට (ජී) දක්වා ඡේදයන්ද, පැ.10(ඒ), පැ.10(බී) පැ.10(සී) ලේඛන පිලිගන්නා බවත්, එහි සඳහන් අන් සියලු සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරන බවත්ය. තවදුරටත්

පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, 2004 අගෝස්තු මස පත් කරන ලද කොමිටිය අවසාන වාර්තාවන් ඉදිරිපත් නොකළ බවත්, අග විනිසුරුතුමාගේ නියමය පරිදි පාර්ශවයන් අතර, සමථයක් ඇති කිරීමට කටයුතු කළ හෙයින් ඉහත කී කොමිටියේ කටයුතු නතර කරන ලද බවත්ය. තවදුරටත් පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ පැ.09 ලෙස ලකුණු කරන ඇති ලේඛනයෙහි අත්සනක් නොමැති බවය.

11. පෙත්සමෙහි 14, 15(ඒ), 18, 19, 20, 22 සහ 23(ඒ) ඡේදයට සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයයන්හි සම්ප්‍රකාශවලට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ එහි සඳහන් පැ.11, පැ13(ඒ) සිට (ජී) ලෙස ලකුණු කර ඇති ලේඛන පිළිගන්නා බවය.

මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, එකී පැ.11 ලේඛනය ප්‍රතිව්‍යුහ කිරීමට ඉදිරිපත් කරන ලද යෝජනාවක් පමණක් බවත්, පසුව එකී යෝජනාව ප්‍රතිව්‍යුහ කිරීම හා පාර්ශවයන් අතර සමථයන් ඇති කිරීමට වෙනස් කරන ලද අතර, එකී වෙනස් කිරීම 2005 ඔක්තෝබර් 05 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද බවයි. එකී කැබිනට් තීරණය ජී.1 ලෙස ලකුණු කොට මේ සමග ඉදිරිපත් කරන අතර, එය මෙම විරෝධතා ප්‍රකාශයේම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටී. ඉහත සම්ප්‍රකාශවලට පටහැනිව ඉහත කී ඡේදයෙහි සඳහන් අනිකුත් සියලුම සම්ප්‍රකාශයන් මෙම වගඋත්තරකරු ප්‍රතික්ෂේප කර සිටී.

මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ පෙත්සම්කරු විසින් පවසන ආකාරයට ජී.11 ලේඛනයෙහි සඳහන් ණය මුදල් පැහැර හරින ලද හෝ ඉෂ්ඨ නොකරන ලද ණයක් නොවන බවයි.

12. පෙත්සමේ 16 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සඳහන් සම්ප්‍රකාශයන් මෙම වගඋත්තරකරු ප්‍රතික්ෂේප කර සිටී.

13. පෙත්සමේ 17 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් එහි සඳහන් කරුණු වල සත්‍යතාවය නොදන්නා හෙයින් එකී සම්ප්‍රකාශයන් මෙම වගඋත්තරකරු ප්‍රතික්ෂේප කර සිටී.

14. පෙත්සමේ 21(ඒ) ඡේදයට සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, පැ.14 ලෙස ලකුණු කරන ලද ලේඛනය පිළිගන්නා අතර, එහි අනිකුත් සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කර සිටින බවයි.

15. පෙත්සමේ 23(බී),(සී), (ඩී), (ඊ) ඡේදයන් සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දෙමින් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ එච්.ඩී.එල්. සමාගමේ ප්‍රතිව්‍යුහ කිරීමට ගන්නා ලද සියලුම කටයුතු නිෂ්ඵල වී ඇති බවට පෙත්සම්කරු විසින් කර ඇති ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන බවත්, එකී එච්.ඩී.එල්. සමාගම ඈවර කිරීම යුක්ති සහගත නොවන බවය.

16. පෙත්සමේ 24 ඡේදයෙහි සහ දිවුරුම් ප්‍රකාශයේ ඊට අනුරූපී ඡේදයන්හි සඳහන් සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරමින් මෙම වගඋත්තරකරු එකී කරුණු ඔප්පු කිරීමේ භාරය පෙත්සම්කරු වෙත පවරා සිටී.

17. මෙම වගඋත්තරකරු විශේෂයෙන්ම ප්‍රකාශ කර සිටින්නේ එච්.ඩී.එල්. සමාගමෙහි විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් නොමැති හෙයින් එකී ගිණුම් ප්‍රකාශ නිසි පරිදි විගණනය නොකර සහ එසේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ පරීක්ෂා නොකොට ගරු අධිකරණය විසින් ඈවර කිරීමට නියෝගයක් කළහොත් එකී නියෝගය සමාගමේ කොටස්කරුවන්ට ද විශේෂයෙන්ම විශාලතම කොටස්කරු වන ශ්‍රී ලංකා ජනරජයද , ශ්‍රී ලංකා ජනරජයේ මහජනතාවටද අවාසි සහගත වන බවයි.

18. ඉහත සම්ප්‍රකාශයන්ට අගති රහිතව මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ,

එච්.ඩී.එල්. සමාගමේ කොටස් හිමිකම් දළ වශයෙන්:

i. i ලේකම්, මහාභාණ්ඩාගාරය 65%
   ii ජපන් කොටස්කරුවන් 27.5%
   iii මහජනතාව 7.5%

ii. එච්.ඩී.එල්.සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධ්‍යක්ෂකවරු 11 දෙනා අතුරින් 06 දෙනෙකු ශ්‍රී ලංකා ජනරජයත්, 02කු ජපන් ණයකරුවනුත්, තවත් 02කු කෝනල් සහ සමාගම වෙනුවෙන් සහ තවත් එක් අයෙකුත් වාර්ෂික මහ සභා රැස්වීමට පත් කළයුතු බවත්,

iii. ශ්‍රී ලංකා ජනරජය සතුව එච්.ඩී.එල්. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වැඩි ඡන්ද බලයක් තිබෙන හෙයින් එකී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තිරණ ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතිපත්ති සමග අනුරූප වන අතර, වෙනත් කරුණු අතර ශ්‍රී ලංකා ජනරජයේ සහ මහජනතාවගේ යහපත පිණිස වන්නේය.

iv ශ්‍රී ලංකා ජනරජයට අදාළ කොටස් පවරන ලද්දේ ජපන් ණයකරුවන්ට දෙන ලද ඇපය දීමේදී විදේශ ණය පනතෙහි ප්‍රතිපාදනයන් සපුරා දීම සඳහා බවත්,

v එච්.ඩී.එල්. සමාගමේ ප්‍රධාන කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා ජනරජයේ දැනට ඇති ප්‍රතිපත්තිය වන්නේ එකී සමාගම ඈවර කිරීමට විරුද්ධ වීමය.

2007 ජනවාරි 24 දින අමාත්‍ය මණ්ඩලය රැස්වීමේදී එච්.ඩී.එල්.සමාගම ඈවර කිරීමට විරුද්ධ වීමට තිරණය කරන ලද අතර, එච්.ඩී.එල්.සමාගම ප්‍රතිව්‍යුහ කිරීමට අනුමැතිය දෙන ලදි. එකී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි 21 දිනැති සංදේශය සහ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තිරණ පී.2 සහ පී.3 ලෙස ලකුණු කොට මේ සමග ඉදිරිපත් කරන අතර, එය මෙම විරෝධතා ප්‍රකාශයේම කොටස් ලෙස සලකන මෙන් අයැද සිටි

vi 1995 ජූනි 28 දින අත්සන් කරන්නට වූ සමථ ගිවිසුම අනුව මිට්සුයි සහ කයිසේ සමාගම් වලට අදාළ මුදල සම්පූර්ණයෙන් ගෙවන තෙක් ශ්‍රී ලංකා ජනරජය විසින් ඔවුනට ලැබිය යුතු මුදල් ලබා ගැනීමට ඉල්ලීමක් නොකරන බවට ශ්‍රී ලංකා ජනරජය විසින් බාරගෙන ඇති බවත්, එකී ගිවිසුමේ සත්‍ය පිටපතක් පී.4 ලෙස ලකුණු කර මේ සමග අමුණා ඇති අතර, එය මෙම විරෝධතා ප්‍රකාශයේම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටි.

vii පී.4 ලෙස ලකුණු කරන ලද ගිවිසුම 5(ඊ) ඡේදයෙහි සඳහන් කරුණුවලට යටත්ව එච්.ඩී.එල්. සමාගම දැනට ශ්‍රී ලංකා ජනරජයට මුදලක් ගෙවීමට නැති බවත්,

viii ශ්‍රී ලංකා ජනරජය විසින් ජනරජයට ලැබිය යුතු මුදල ලබා ගැනීමට එච්.ඩී.එල්. සමාගමට ඉල්ලීමක් කර නොමැති බවත්, එසේ හෙයින් දැනට එච්.ඩී.එල්. සමාගම ශ්‍රී ලංකා ජනරජයට කිසිදු මුදලක් ගෙවීම පැහැරහැර නොමැති බවත්, සහ/හෝ ගෙවීමට හෝ දැනට ගෙවීමට නොමැති බවත්ය.

එසේ හෙයින් පෙත්සම්කරු විසින් දක්වා ඇති ණය වාර්ථමානයේ පවතින ණයක් වුවත් එය ගෙවිය යුතු තත්ත්වයට පත්වී ඇති නොමැති බවත්,

ix දැනට එච්.ඩී.එල්. සමාගමේ විගණනය කරන ලද ගිණුම් නොමැති හෙයින් ගරු අධිකරණය විසින් එච්.ඩී.එල්. සමාගම ඈවර කිරීම සාධාරණ සහ/හෝ යුක්ති සහගත බවට තිරණය කිරීමට පදනමක් නොමැති බවත්,

x මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, එච්.ඩී.එල්. සමාගම ඈවර කිරීම මහජන සුභසිද්ධිය හෝ යුක්තිය පසිඳලීමට නොවන බවය.

xi එම හේතුමත මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, එච්.ඩී.එල්. සමාගම ඈවර කිරීමට සාධාරණ හෝ යුක්ති සහගත කරුණු කිසිවක් නොමැති බවය.

19. ඉහත කරුණු වලට අගති රහිතව මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ,

i. ඈවර කිරීම වෙනුවට විකල්ප ක්‍රියා මාර්ග ලෙස ශ්‍රී ලංකා ජනරජයට සිය කොටස්, කොටස් වෙළඳපොළට විකිනීමට හැකි බවත්, පී.3 ලෙස ලකුණු කරන ලද අමාත්‍ය මණ්ඩල තිරණය පරිදි එච්.ඩී.එල්. සමාගම ප්‍රතිව්‍යුහ කිරීමට හැකි බවත්, හෝ අලුත් යෝජනා ඇදා ගැනීමට කටයුතු කළහැකි බවත්,

iii එච්.ඩී.එල්. සමාගම මූල් පදනමෙහි තවදුරටත් රඳා පවතින බවත්ය.

20. මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ,

(i) ඈවර කිරීම සඳහා කර ඇති ඉල්ලීම අසද්භාවයෙන් සහ/හෝ අධිකරණ බලය වැරදි ආකාරයට භාවිතා කිරීමක් හා/හෝ

(ii) පෙත්සම්කරුට මෙම නඩුව නිතියෙන් පවරා පවත්වාගෙන යාමට කිසිදු නෛතික පදනමක් නොමැති බවත්,

(iii) පෙත්සම්කරුගේ පෙත්සමේ සම්ප්‍රකාශයන් සහ දිවුරුම් පෙත්සමේ ඊට අනුරූප ජේදවලට අනුව මෙම නඩුව පවත්වාගෙන යාමට කිසිදු පදනමක් නොමැති බවත්,

(iv) පෙත්සමේ ඉල්ලා ඇති සහන ප්‍රදානය කිරීමට ගරු අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත්,

(v) පෙත්සම්කරු අනුගම්‍ය (mandatory) නෛතික ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කර නොමැති බවත්,

(vi) මෙම ඉල්ලීම ගොනු කළ දින සිට වගඋත්තරකරු හට අලාභ හා පාඩු සිදු වී ඇති බවත්, එය ප්‍රධාන කොටස්කරු වන ශ්‍රී ලංකා ජනරජයට බලපා ඇති බවත්, එකී ඉල්ලීම ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ආයෝජනය කරනු ලබන ආයෝජකයන් ක්ෂේත්‍රය පිළිබඳව තබා ඇති විශ්වාසයට බලපෑම් කරන බවත්,

(vii) හිල්ටන් සමාගම සඳහා බලපැවැත්වෙන පරිපාලන ගිවිසුම 2007 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන්වන බවත්, පාර්ශවයන් එකා හොඳ කොන්දේසි යටතේ එය නැවත අලුත් කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතින බවත්, මෙම ඉල්ලීම ශ්‍රී ලංකා ජනරජය සහ එච්.ඩී.එල් සමාගම අතර පවතින එකී සාකච්ඡා සඳහා අහිතකර බලපෑම් ඇති කරනු ලබන බවත්ය.

21. එකී හේතූන් මත මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, එච්.ඩී.එල් සමාගම ඈවරකරණය කිරීම අසාධාරණ බවත්, ඈවරකරණය කිරීමට අතිරේකව වෙනත් විකල්ප සහනයන් ඇති බවත්, එච්.ඩී.එල් සමාගමේ ඈවරකරණය කිරීමට තරයේ විරුද්ධ වන බවත්ය.

22. ඉහත කරුණුවලට අගති රහිතව මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරු වර්තමානයේ සමාගමේ කොටස් 70,000 ක් දරණ බවත්, එය එච්.ඩී.එල් සමාගමේ සමස්ථ කොටස්වල ප්‍රතිශතයක් වශයෙන් 0.15% ක් පමණක් බවත්ය. විකල්පයක් වශයෙන් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, ප්‍රධාන කොටස්කරු වන ශ්‍රී ලංකා ජනරජය, පෙත්සම්කරු සතු එකී කොටස් වර්තමාන වෙළඳ පොළ වටිනාකම අනුව මිලදී ගැනීමට සූදානම් බවත්ය.

23. මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, හිල්ටන් හෝටල් සමාගම පාලනය කරනු ලබන්නේ, ජාත්‍යන්තරව පිළිගත් හෝටල් දාමයකින් බවත්, එය ශ්‍රී ලංකාවේ නාමය ගෙනයනු ලබන හෝටලයක් (Flagship) බවත්ය. එය සංචාරක ව්‍යාපාරය දිරිගන්වන බවත්, වර්තමානයේ ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතිපත්තිය වන්නේ, ශ්‍රී ලංකා හිල්ටන් හෝටලය පවත්වාගෙන යාම බවත්ය. මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, දැනට ශ්‍රී ලංකා ජනරජය ආර්ථිකය සංවර්ධනය සඳහා සෘජු විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට පැමිණීම දිරිගන්වන බවත්., හිල්ටන් හෝටල් සමාගම

ඇවරකරණය කිරීම ආර්ථිකයට විදේශ ආයෝජනයට හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට බලපෑම් ඇති කරන බවත්ය.

24. මෙම වගඋත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, යම් හෙයකින් මෙම දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ප්‍රමාදයක් වූයේ නම්, එකී ප්‍රමාදයට හේතු වූයේ එච්.ඩී.එල් සමාගමේ ගොනු සහ ලේඛණ දැනට අස්ථාන ගත වී ඇති හෙයින්, එසේ හෙයින් මෙම වගඋත්තරකරු හට පෙත්සමේ සඳහන් කරුණුවල සත්‍යතාවය සහ නිරවද්‍යතාවය සොයා ගැනීමට වෙනත් මූලාශ්‍රයන් සොයා යාමට සිදු වීමත්, ඒ සඳහා කාලයක් ගත වූ බවත්ය.

එසේ හෙයින් මෙම වගඋත්තරකරු ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ,

(අ) පෙත්සම්කරුගේ පෙත්සම නිෂ්ප්‍රභා හා/හෝ ප්‍රතික්ෂේප කරන ලෙසත්,

(ආ) නඩු ගාස්තු සහ

(ඇ) ගරු අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ලබා දෙන ලෙසත්ය.

Wickramasinghe
වගඋත්තරකරුගේ නීතිඥ.

*මබා/hilltan-OB*